ඉතාලිය

MINISTERO DELL'INTERNO

euaa EUROPEAN UNION AGENCY FOR ASYLUM

# පිළිගැනීම තුළ ඔබේ අයිතීන් සහ වගකීම්



**මෙම තොරතුරු ඔබ සඳහායි:**

- ඔබට වයස අවුරුදු 18 ට අඩු  නම්
- ඔබ පැමිණියේ ඔබේ දෙමව්පියන්ගෙන් එක් අයෙකු හෝ දෙදෙනාම සමඟ නම්
- ඉතාලිය හි රැකවරණය (ජාත්‍යන්තර ආරක්ෂාව ලෙසද හැඳින්වේ) සඳහා ඔබ ඉල්ලුම් කර ඇත්නම්

SINHALESE

# පටුන


| | |
|---|---|
| ඔබ මෙම රට තුළ ආරක්ෂිතයි | 3 |
| ඔබට උපකාර කරන්නේ කවුද? | 3 |
| භාරකරුගේ කාර්යභාරය කුමක්ද? | 3 |
| ඔබට උපකාර කළ හැකි වෙන අය කවුරුන්ද? | 4 |
| ඔබට ලැබෙන්නේ මොනවාද? | 6 |
| සෞඛ්‍ය සේවා සඳහා අයිතිය | 8 |
| කාර්ය මණ්ඩලයට සහ භාරකරුට දැනුම් දෙන්න | 9 |
| හොඳම අවශ්‍යතා තක්සේරුවක් යනු කුමක්ද? | 10 |
| අධ්‍යාපනයට ඇති අයිතිය | 10 |
| රැකියාවක නිරත වීමට ඇති අයිතිය | 11 |
| ඔබේ රැකවරණය සොයන්නාගේ ලේඛනය | 11 |
| ඔබ නැවතී සිටින්නේ කොහේද? | 12 |
| කෙනෙක් ඔබට නරක ලෙස සැලකුවහොත් ඔබට කළ හැක්කේ කුමක්ද? | 13 |
| පිළිගැනීම තුළ ඔබේ වගකීම් මොනවාද? | 14 |
| ඔබ ඔබේ වගකීම් සමඟ අනුකූල නොවන්නේ නම් කුමක් සිදුවේද? | 15 |
| රැකවරණය සඳහා අයදුම් කිරීම සහ EU+ රටවලට ගමන් කිරීම සඳහා වන නීති | 16 |
| ඔබ EU+ රටවලින් එකකට පලා ගියහොත් කුමක් සිදුවේද? | 17 |
| බලධාරීන් විසින් ගනු ලබන තීරණයකට ඔබ එකඟ නොවන්නේ නම්, ඔබට උපකාර කළ හැක්කේ කාටද? | 18 |
| යම් සහායක් වෙනස් වුවහොත් කුමක් සිදුවේද? | 19 |
| සම්බන්ධතා තොරතුරු | 20 |

## ඔබ මෙම රට තුළ ආරක්ෂිතයි

ඔබ අනතුරක සිටින නිසා ඔබේ රටට ආපසු යා නොහැකි බව ඔබ බලධාරීන්ට පැවසූ අතර ඔබ රැකවරණය සඳහා ඉල්ලුම් කර ඇත. ඔබ ඉතාලිය හි රැකවරණය සොයන්නෙකු වේ.

සෑම දෙයක්ම අලුත් යැයි හැඟීම සාමාන්‍ය දෙයකි. ඔබ මේ රට තුළ සුරක්ෂිත වන අතර ඔබ හුදකලා නොවනු ඇත.

## ඔබට උපකාර කරන්නේ කවුද?

යුරෝපයේ, වයස අවුරුදු 18 ට අඩු සෑම කෙනෙකු ම දරුවෙකු ලෙස සැලකෙන අතර **විශේෂ සහාය** ලබා ගැනීමේ අයිතිය ඇත.



ඔබ මෙහි සිටින්නේ ඔබේ දෙමාපියන් නොමැතිව නිසා, භාරකරුවෙකු ලෙස හඳුන්වන තවත් වැඩිහිටියෙකු ඔබේ අවශ්‍යතා සඳහා ඔබට උපකාර කරනු ඇත. මෙම පුද්ගලයා බලධාරීන්ගෙන් ස්වාධීනය.

ඔබට තවමත් ඔබේ භාරකරු හමු වී නොමැති නම්, හැකි ඉක්මනින් ඔබට ඔවුන්ව හමුවනු ඇත.

එතෙක්, බලධාරීන් ඔබට සහාය වීමට සහ ඔබව නියෝජනය කිරීමට තවත් වැඩිහිටියෙකු පත් කරනු ඇත.

## භාරකරුගේ කාර්යභාරය කුමක්ද?

ඔබේ භාරකරු  ඔබේ නැවතී සිටීම පිළිබඳව ඔබ දැනගත යුතු සියල්ල ඔබට පැහැදිළි කර දී ඔබේ ගැටලුවලට පිළිතුරු සොයා ගැනීමට ඔබට උපකාර කරයි. උදාහරණයක් ලෙස, ඔබට පාසලට යා හැකි ආකාරය, වෛද්‍යවරයෙකු හමුවිය හැකි ආකාරය, ඔබ ජීවත් වනු ඇති ස්ථානය, ඔබේ පවුලේ අය සොයාගත හැකි හෝ සම්බන්ධ කරගත හැකි ආකාරය පිළිබඳවයි. අනෙකුත් කාර්ය මණ්ඩලය  ද මෙම ගැටලු සඳහා ඔබට උපකාර කරනු ඇත.

ඔබේ භාරකරුඔබට අවශ්‍ය මොනවාද යන්න බලධාරීන්ට පවසයි, ඔබට උපදෙස් ලබා දෙයි සහ වැදගත් තීරණ ගැනීමට ඔබට සහාය වෙයි.

ඔබට සැමවිටම ඔබේ අවශ්‍යතා සහ හැඟීම් ප්‍රකාශ කළ හැකි අතර ඔබේ භාරකරුට ඔබේ අදහස පැවසිය හැකිය.

ඔබේ භාරකරු සමඟ ඔබට ගැටලුවක් ඇත්නම්, කාර්ය මණ්ඩලයට  පවසන්න.

## ඔබට උපකාර කළ හැකි වෙන අය කවුරුන්ද?



- **සමාජ සේවකයෙකු** ඔබේ එදිනෙදා අවශ්‍යතා සඳහා ඔබට උපකාර කරනු ඇත නැතහොත් නිශ්චිත ගැටලුවකට උපකාර කළ හැකි වෙනත් වෘත්තිකයන් සම්බන්ධ කර ගනු ඇත.
- ඔබට අසනීප ගතියක් දැනේ නම්, තුවාල වී ඇත්නම් හෙෝ ඔබට ඕනෑම ආකාරයක වෛද්‍ය ආධාර අවශ්‍ය නම් **වෛද්‍යවරයෙකු** හෙෝ **හෙදියක** ඔබට උපකාර කරනු ඇත.
- ඔබට දුකක්, කෙෝපයක්, බියක්, කනස්සල්ලක් දැනේ නම් හෙෝ නිදා ගැනීමට අපහසු බවක් දැනේ නම් **මනෙෝ විද්‍යාඥයෙකු** ඔබට උපකාර කරනු ඇත.
- රැකවරණ ක්‍රියාපටිපාටිය අතරතුර කුමක් සිදුවේද යන්න සහ ඔබේ අයිතීන්ට ගරු නොකරන බව ඔබ විශ්වාස කරන්නේ නම්, **නීති උපදේශකයෙකු** ඔබට වටහා ගැනීමට උපකාර කරනු ඇත.
- ඔබට වැටහෙන භාෂාවකින් සන්නිවේදනය කිරීමට **පරිවර්තකයෙකුට** උපකාර කළ හැකිය. ඔවුන්ගේ කාර්යභාරය වන්නේ ඔබ සහ අනෙක් අය පවසන දේ ඒ ආකාරයෙන්ම පරිවර්තනය කිරීමයි.
- මධ්‍යස්ථානයේ හෙෝ පාසලේ සිටින ගුරුවරයෙකුට, ඔබට අධ්‍යයනය කිරීමට සහ නව දේ ඉගෙන ගැනීමට උපකාර කළ හැකිය.

## වයස් තක්සේරුව යනු කුමක්ද?




ඔබ යුරෝපයට පැමිණියේ ඔබේ වයස සනාථ කරන ලියවිල්ලක් නොමැතිව නම් සහ බලධාරීන්ට ඔබේ වයස පිළිබඳව සැකයක් ඇත්නම්, **වයස් තක්සේරුව** නම් ක්‍රියාපටිපාටියකට සහභාගී වන ලෙස ඔවුන් ඔබෙන් ඉල්ලා සිටිනු ඇත. මේ ලෙස, ඔවුන් ඔබව දරුවෙකු ලෙස සලකනවාද නැද්ද යන්න ඔවුන්ට තීරණය කළ හැකිය.
වයස් තක්සේරුවකට සහභාගී වීමට ඔබෙන් ඉල්ලා සිටියහොත්, ඔබේ භාරකරු ඔබට ක්‍රියාපටිපාටිය පැහැදිළි කරනු ඇත.

## ඔබේ පවුලේ අය සමඟ සම්බන්ධ වීමට අවශ්‍ය නම් ඔබට කළ හැක්කේ කුමක්ද?



- ඔබේ පවුලේ අය කොහේදැයි ඔබ නොදන්නේ නම්, හෝ ඔවුන් සමඟ සම්බන්ධතා නැති වී ඇත්නම්, ඔබට ඔබේ භාරකරුගෙන් හෝ කාර්ය මණ්ඩලයෙන් සහාය ඉල්ලා සිටිය හැකිය. ඔබේ පවුල සෙවීමට ඔවුන් ඔබට උපකාර කරනු ඇත.
- ඔබේ පවුලේ අය කොහේදැයි ඔබ දන්නේ නම් සහ ඔවුන්ගේ සම්බන්ධතා තොරතුරු ඔබ සතුව තිබේ නම්, ඔබට අවශ්‍ය නම් ඔවුන්ව ඇමතීමට කාර්ය මණ්ඩලයට ඔබට උපකාර කළ හැකිය.
- යුරෝපයේ ඔබේ පවුලේ අය සිටී නම්, ඔබේ පවුල පිළිබඳව ඔබ දන්නා සියල්ල කාර්ය මණ්ඩලයට පවසන්න.

## ප්‍රවේශම් වන්න, ඇතැම් අය ඔබව අනතුරේ හෙළීමට ඉඩ ඇත



ඔබට මේ රට හැර යාමට සිතෙන්නට හැකිය, නැතහොත් ඇතැම් අය ඔබව පලා යාමට ඒත්තු ගැන්වීමට උත්සාහ කරනු ඇත. එය ඔබට අනතුරුදායක විය හැකි අතර ඔබේ රැකවරණ අයදුම්පතට සෘණාත්මක ප්‍රතිවිපාක ඇති කළ හැකිය.
ඔබේ භාරකරු/නියෝජිතයා සහ කාර්ය මණ්ඩලය සමඟ කතා කරන්න, ඔබට ඔවුන්ට තත්වය පැහැදිලි කළ හැකි අතර ඔවුන්ට ඔබට උපදෙස් ලබා දිය හැකිය.

## ඔබට ලැබෙන්නේ මොනවාද?

බලධාරීන් ඔබේ රැකවරණ අයදුම්පත පරීක්ෂා කරන තෙක් ඔබ රැඳී සිටින අතරතුර ඔබට විවිධ ආකාරයේ සහාය සහ සේවාවන් ලැබෙනු ඇත. මෙය **පිළිගැනීම** ලෙස හැඳින්වේ.


දරුවෙකු ලෙස සහ රැකවරණය සොයන්නෙකු ලෙස ඔබට අයිතීන් ඇති අතර, ඔබ ගරු කළ යුතු වගකීම්ද ඇත. මේවා මෙම විස්තර පත්‍රිකාවේ පැහැදිලි කර ඇත.

මෙම විස්තර පත්‍රිකාවේ ඇති තොරතුරු ඔබට ලැබුණු බව තහවුරු කරන ලෙස කාර්ය මණ්ඩලය ඔබෙන් අසනු ඇත. මෙම විස්තර පත්‍රිකාවේ කොටස් ඔබට වැටහෙන්නේ නැත්නම් හෙෝ ඔබට කිසියම් ප්‍රශ්නයක් ඇත්නම්, භාරකරුගෙන්සහ කාර්ය මණ්ඩලයෙන් අසා දැනගන්න.

ඔබ මෙම රට තුළ නැවතී සිටින කාලය තුළ, ඔබේ විශේෂිත තත්ත්වය අනුව ඔබේ භාරකරු සහ කාර්ය මණ්ඩලය ඔබට අමතර තොරතුරු ලබා දෙනු ඇත. ඔබට ඕනෑම වේලාවක ප්‍රශ්න ඇසිය හැකිය.



**ඔබට මේවා ලැබෙනු ඇත:**



- නිදා ගැනීමට ස්ථානයක්



- ආහාර



- පුද්ගලික සනීපාරක්ෂක නිෂ්පාදන



- ඇඳුම් පැළඳුම්



- දෛනික වියදම් සඳහා මුදල්

## සෞඛ්‍ය සේවා සඳහා අයිතිය

**ඔබට අවශ්‍ය සෞඛ්‍ය සේවාව ඔබට ලැබෙන බවට බලධාරීන් සහතික වනු ඇත.**

**ඔබට ඇති ඕනෑම වෛද්‍ය ගැටලුවක් පිළිබඳව කාර්ය මණ්ඩලයට සහ ඔබේ භාරකරුටඔබට දැනුම් දිය හැකිය.** ඔබට අවශ්‍ය නම් හෙදියක හෝ වෛද්‍යවරයෙකු හමුවීමට ඔවුන් ඔබට උපකාර කරනු ඇත.




වෛද්‍යවරයා එය අවශ්‍ය යැයි සලකන්නේ නම්, ඔවුන් ඖෂධ සහ විශේෂඥයින් හමුවීමට පැමිණීම් ද නියම කරනු ඇත.

ඔබට හෙදියක හෝ වෛද්‍යවරයෙකු සමඟ වෛද්‍ය පරීක්ෂණයකට සහභාගී විය වීමට සිදුවේද යන්න කාර්ය මණ්ඩලය සහ භාරකරු ඔබට දන්වනු ඇත. ඔවුන් ඔබේ සෞඛ්‍යය පිළිබඳව පරීක්ෂා කර ඔබට අවශ්‍ය සහාය ලබා දෙනු ඇත.


ඔබට හදිසි වෛද්‍ය ආධාර හෝ හදිසි ප්‍රතිකාර අවශ්‍ය ඕනෑම තුවාලයක් ඇත්නම්, කාර්ය මණ්ඩලයට දන්වන්න. ඔබ නැවතී සිටින ස්ථානයෙන් පිටත සිටී නම්, ඔබට හදිසි අවස්ථා අංකය වන 112 ට නොමිලේ ඇමතිය හැකිය.

## කාර්ය මණ්ඩලයට සහ භාරකරුට දැනුම් දෙන්න:



- ඔබට අසනීප වී, තුවාල ලබා හෝ හදිසි වෛද්‍ය ආධාර හෝ ප්‍රතිකාර අවශ්‍ය නම්
- ඔබ මත්ද්‍රව්‍ය භාවිත කරන්නේ නම් හෝ මත්පැන් පානය කරන්නේ නම්
- ඔබ අතීතයේ දී ප්‍රචණ්ඩත්වය හෝ අපයෝජනය අත්විඳ ඇති හෝ දැන් එය අත්විඳිමින් සිටී නම්
- ඔබ ගැබ්ගෙන සිටී නම් ගැබ්ගෙන සිටිය හැකි නම්
- ඔබට තනිවම ඇවිදීමට නොහැකි හෝ ඔබට ඇසීමේ සහ දැකීමේ අපහසුතා තිබේ නම්
- ඔබට කනස්සල්ලක්, දුකක් දැනෙනවා නම්, ඔබට නිදාගත නොහැකි නම් හෝ ඔබට ඍණාත්මක සිතුවිලි තිබේ නම
- ඔබට අනාරක්ෂිත බවක් දැනෙනවා නම් හෝ යමෙකුට, ආගන්තුකයෙකුට හෝ ඔබ දන්නා පුද්ගලයෙකුට පවා බිය නම්
- ඔබට කිරීමට අවශ්‍ය නැති දේවල් කිරීමට ඔබට බල කර තිබේ නම් හෝ බල කරන්නේ නම්
- ඔබේ ඇඳහිල්ල, ඔබ ආදරය කරන අය, ඔබ අඳින පළඳින ආකාරය හෝ හැසිරෙන ආකාරය නිසා ඔබට අනාරක්ෂිත බවක් දැනේ නම්.

කාර්ය මණ්ඩලය සහ ඔබේ භාරකරු උපකාර කිරීමට මෙහි සිටින බව මතක තබා ගන්න.



## හොඳම අවශ්‍යතා තක්සේරුවක් යනු කුමක්ද?



- ඔබේ **අවශ්‍යතා** වටහා ගැනීමට
- ඔබට අවශ්‍ය කුමන **සහාය** ද තීරණය කිරීම

ඔබෙන් ප්‍රශ්න අසන අනෙකුත් කාර්ය මණ්ඩලය සමාජ සේවක හෝ මනෝවිද්‍යාඥ ඔබට දැකගත හැකි ක්‍රියාකාරකමකි.

මෙය බලධාරීන්ට වැදගත් තීරණ ගැනීමට උපකාරී වනු ඇත, උදාහරණයක් ලෙස ඔබ නැවතී සිටින ස්ථානය.

ඔබට හෙදිය, වෛද්‍යවරයා, කාර්ය මණ්ඩලය සහ ඔබේ භාරකරු විශ්වාස කළ හැකිය. ඔබට ඔවුන් සමඟ ඕනෑම දෙයක් බෙදා ගත හැකිය ඔබ පවසන කිසිවක් ඔබේ අවසරයකින් තොරව ඔබේ භාරකරු/නියෝජිතයා හැර වෙනත් කිසිවෙකු සමඟ බෙදා නොගනු ඇත. එසේ නොවන්නේ නම් ඒ ඔබේ හෝ වෙනත් අයෙකුගේ ජීවිතය අවදානමට ලක්ව ඇත්නම් පමණි.

*සහ අවශ්‍ය පරිදි වෙනස් කළ හැකි* ඔබේ භාරකරු දැනුවත් කිරීමට හෝ සම්බන්ධ කර ගැනීමට ඔබට අවශ්‍ය නැතිනම්, කාර්ය මණ්ඩලයට දන්වන්න. ඔවුන් ඔබේ ඉල්ලීම පරීක්ෂා කර ඔබට වඩාත් සුදුසු දේ මත පදනම්ව තීරණය කරනු ඇත.

## අධ්‍යාපනයට ඇති අයිතිය



දරුවෙකු ලෙස, ඔබට අධ්‍යාපනය ලැබීමට සහ ඉගෙනීමට අයිතිය තිබේ. ඔබ පාසල් ගොස් මෙම කාලය තුළ ඔබට වයස අවුරුදු 18 ක් සපිරෙන්නේ නම්, පාසල් අධ්‍යාපනය අවසන් වන තුරු ඔබට ඔබේ පැමිණීම දිගටම කරගෙන යා හැකිය.

ඔබේ භාරකරු සහ කාර්ය මණ්ඩලය ඔබට මෙරට පාසලේ ලියාපදිංචි වීමට සහාය වනු ඇත. මූලික භාෂා පන්ති සහ අනෙකුත් පාඨමාලා පිළිබඳව ඔවුන් ඔබට දැනුම් දෙනු ඇත. ඔබට මෙම පාඨමාලා කිහිපයකට සහභාගී වීමට සිදු විය හැකිය.

ඔබට ඉගෙනීමට, සංවර්ධනය වීමට සහ නව මිතුරන් ඇති කර ගැනීමට උපකාර කිරීම සඳහා අධ්‍යාපනික සහ විනෝදාත්මක ක්‍රියාකාරකම් පිළිබඳව කාර්ය මණ්ඩලය ඔබට පවසනු ඇත.

## රැකියාවක නිරත වීමට ඇති අයිතිය

ඔබේ වයස සහ ඔබේ තත්ත්වය අනුව, ඔබට අවශ්‍ය නම්, ඉතාලියහි රැකියාවක නිරත වීමට ඔබට අවසර ලැබිය හැකිය. ඔබේ භාරකරු සහ කාර්ය මණ්ඩලය ඔබට වැඩිදුර තොරතුරු ලබා දෙනු ඇත.





ඔබේ දේශපාලන රැකවරණ අයදුම්පත නිල වශයෙන් ඉදිරිපත් කිරීමෙන් දින 90කට පසු ඔබට රැකියාවක නිරත වීමට අවසර ලැබිය හැකිය.

වයස අවුරුදු 16ට අඩු පුද්ගලයින්ට රැකියාවක නිරත විය නොහැක.



## ඔබේ රැකවරණය සොයන්නාගේ ලේඛනය

ඔබේ නම සහ ඡායාරූපය සහිත පුද්ගලික ලේඛනයක් ඔබට ලැබෙනු ඇත. මෙයින් පෙන්නුම් කරන්නේ ඔබ ඉතාලිය හි රැකවරණය සොයන්නෙකු බවයි. ඔබ එය සැමවිටම ඔබ සමඟ රැගෙන යා යුතුය.



**මෙම ලේඛනය වැදගත් එකකි. එය නැති කර නොගැනීමට සහ වෙනත් අයෙකුට ලබා නොදීමට වගබලා ගන්න.**

## ඔබ නැවතී සිටින්නේ කොහේද?

බලධාරීන් ඔබේ රැකවරණ අයදුම්පත පරීක්ෂා කරන අතරතුර ඔබ රැඳී සිටින ස්ථානය රඳා පවතින්නේ ඔබේ වයස සහ අවශ්‍යතා මතයි.







ඔබේ භාරකරු සහ කාර්ය මණ්ඩලය **ඔබ නැවතී සිටිය යුතු ස්ථානය** ඔබට දන්වනු ඇත, උදාහරණයක් ලෙස යම් නිශ්චිත නවාතැන් පහසුකමක් හෙෝ බලධාරීන් විසින් නම් කරන ලද නගරයක් තුළ පිහිටි මෙවැනි ස්ථාන, බාලවයස්කරුවන් භාර ගැනීම සඳහා පමණක්ම වෙන් කර ඇත; කෙසේ වෙතත්, වැඩිහිටියන් සඳහා වන මධ්‍යස්ථානයක් තුළ බාලවයස්කරුවන් වෙනුවෙන් වෙන් කළ කොටස්වල සීමිත කාලයක් ඔබට රැඳී සිටීමට **බලධාරීන් විසින් තීරණය කරන ලද ස්ථානයේ දී පමණක් ඔබට සහාය සහ සේවාවන් ලැබිය හැකිය.**

ඉතාමත් කලාතුරකින්, තමන්ට අවශ්‍ය පරිදි යාමට සහ ඒමට නොහැකි මධ්‍යස්ථානයක ළමයින්ව තැබිය හැකිය. ඔබ සිටින්නේ මේ තත්වයේ නම්, ඔබේ භාරකරු, නීති උපදේශකයෙකු සහ කාර්ය මණ්ඩලය ඔබට සහාය වනු ඇත.

**ඔබේ කොතැනක නැවතී සිටියත් ඔබට සුරක්ෂිතව සිටීමට අයිතිය ඇත. කිසිවෙකුට පහත දේ සඳහා ඉඩ නැත:**




ඔබට තර්ජනය කිරීමට

ඔබට අපහාස කිරීමට


ඔබට හානි සිදු කිරීමට

ඔවුන් කවුරුන් වුවත්, ආගන්තුකයෙකු හෙෝ ඔබ දන්නා කෙනෙකු වුවත්.
කාර්ය මණ්ඩලය හෙෝ ඔබේ භාරකරු/නියෙෝජිතයා සමඟ ඔබට කිසියම් ගැටළුවක් ඇත්නම්, ඔබට ඒ පිළිබඳව කතා කළ හැකිය.

## කෙනෙක් ඔබට නරක ලෙස සැලකුවහොත් ඔබට කළ හැක්කේ කුමක්ද?



ඔබ විශ්වාස කරන පුද්ගලයෙකු, තවත් කාර්ය මණ්ඩලයක්, ඔබේ භාරකරු *ජාතික සැකසුම අනුව නිශ්චිත අධිකාරියක/ආයතනයක* සමඟ කතා කළ හැකිය (UNICEF, UNCHR, IOM).



ඔබේ භාරකරු සම්බන්ධයෙන් ඔබට ගැටලු ඇත්නම්, ඒ පිළිබඳව වාර්තා කිරීමට ඔබට අයිතියක් ඇත; ඒ සඳහා කටයුතු කළ යුතු ආකාරය මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය විසින් ඔබට දැනුම් දෙනු ඇත.

**අවධානය පිණිසයි!**

ඔබ නැවතී සිටින ස්ථානයෙන් පිටත සිටී නම් සහ ඔබ අනතුරේ නම්, ඔබට ඕනෑම දුරකථනයකින් ජාතික හදිසි අංකය වන 112ට නොමිලේ ඇමතිය හැකිය.

## පිළිගැනීම තුළ ඔබේ වගකීම් මොනවාද?



ඔබේ කතාව පැවසීමට ඇතැම් විට බියක් හා දුෂ්කර බවක් දැනුණ ද, ඔබ සත්‍යය පැවසීම සහ බලධාරීන් සමඟ සහයෙෝගයෙන් කටයුතු කිරීම වැදගත් වේ. ඔබ තනි වී නැත. ඔබේ භාරකරු සහ කාර්ය මණ්ඩලය ඔබට සවන් දීමට සහ ඔබේ එදිනෙදා අවශ්‍යතා සඳහා ඔබට උපකාර කිරීමට මෙහි සිටී.

කාර්ය මණ්ඩලය ඔබේ තත්ත්වය පිළිබඳව දන්නේ නම් ඔවුන්ට ඔබට උපකාර කළ හැකිය.

ඔබ කොතැනක නැවතී සිටියත්, අනුගමනය කිරීමට නීති තිබේ. උදාහරණයක් ලෙස, ඔබ අනෙකුත් පදිංචිකරුවන්ට සහ කාර්ය මණ්ඩලයට ගරු කළ යුතු අතර, නිහඬ වේලාවන් තුළ ඔබ ඝෙෝෂාකාරී නොවිය යුතුය.

නීති සහ නීති අනුගමනය නොකරන විට ඇතිවන ප්‍රතිවිපාක කාර්ය මණ්ඩලය විසින් පැහැදිළි කරනු ඇත.

ඔබ පහත දේ සිදු කිරීම ඉතා වැදගත් වේ:

- ✔ ඔබ නැවතී සිටින ස්ථානයේ නීති අනුගමනය කරන්න
  - දුම්පානය, මත්පැන් පානය හෙෝ මත්ද්‍රව්‍ය භාවිතය නොකරන්න;
  - අවසර නොලත් වේලාවන්හිදී පරිශ්‍රයෙන් පිටව නොයන්න;
  - එමෙන්ම අවසර නොලත් පුද්ගලයින්ට පරිශ්‍රයට ඇතුළු වීමට ඉඩ නොදෙන්න.
  - බලධාරීන් ඔබට නැවතී සිටීමට පැවසූ ස්ථානයෙන් පලා නොයන්න.
- ✔ කාර්ය මණ්ඩලය සහ ඔබේ භාරකරු ඔබට පැහැදිළි කරන මේ රටේ නීති අනුගමනය කරන්න.

# ඔබ ඔබේ වගකීම්වලට අනුකූල නොවන්නේ නම් කුමක් සිදුවේද?



මෙය සිදුවුවහොත්, ඔබට ඔබේ භාරකරු හෝ කාර්ය මණ්ඩලය සමඟ විවෘතව කතා කළ හැකි අතර ඔබේ තත්ත්වය සහ ඔබට තිබූ හේතු පැහැදිළි කළ හැකිය.

බලධාරීන් ඔබේ තත්ත්වය ඇගයීමට ලක් කර යම් ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කළහොත් ඔබට සහ ඔබේ භාරකරුට දැනුම් දෙනු ඇත.

බලධාරීන්ට මෙසේ තීරණය කළ හැකිය:

- උදාහරණයක් ලෙස, බලධාරීන් ඔබට නැවතී සිටීමට පැවසූ ස්ථානයෙන් ඔබ පලා ගියහොත් හෝ ඔබ බලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු නොකරන්නේ නම්, **ඔබට අඩු සහයෝගයක් ලැබිය හැකිය.**
- ඔබ ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරෙන්නේ නම් හෝ ඔබ නැවතී සිටින ස්ථානයේ නීති නැවත නැවතත් හෝ බරපතල ලෙස කඩ කරන්නේ නම්, **ඔබට ලැබෙන සහයෝගයෙන් කොටසක් ඔබට අහිමි විය හැකිය.** පොලිසිය ද කැඳවිය හැකිය.



**ඔබ දැන් ඉතාලියෙහි සිටින අතර, එය EU රටකි. EU+ රටවල් වන්නේ :**

- යුරෝපීය සංගමයේ (EU) සාමාජික රටවල් 27: ඔස්ට්‍රියාව, බෙල්ජියම, බල්ගේරියාව, ක්‍රොඒෂියාව, සයිප්‍රසය, චෙකියාව, ඩෙන්මාර්කය, එස්තෝනියාව, ෆින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, ග්‍රීසිය, හංගේරියාව, ඉතාලිය, ලැට්වියාව, ලිතුවේනියාව, ලක්සම්බර්ග්, මෝල්ටාව, නෙදර්ලන්තය, පෝලන්තය, පෘතුගාලය, අයර්ලන්ත ජනරජය, රුමේනියාව, ස්ලෝවැකියාව, ස්ලෝවේනියාව, ස්පාඤ්ඤය, ස්වීඩනය සහ
- අනෙකුත් රටවල් 4: අයිස්ලන්තය, ලීච්ටන්ස්ටයින්, නෝර්වේ සහ ස්විට්සර්ලන්තය.

## රැකවරණය සඳහා අයදුම් කිරීම සහ EU+රටවලට ගමන් කිරීම සඳහා වන නීති




ඔබේ භාරකරු **සහ කාර්ය මණ්ඩ ලය** මෙම වැදගත් නීති ඔබට පැහැදිලි කර දෙනු ඇත. ඔබට ඕනෑම වේලාවක ඔවුන්ගෙන් ප්‍රශ්න ඇසිය හැකිය.

- ✓ ඔබ ඉතාලිය තුළ නැවතී සිටිය යුතු අතර අනෙකුත් එක් EU+ රටවලට හෝ පලා නොයා යුතුය.
- ✓ මෙම රටවලින් එකක ඔබේ පවුලේ සාමාජිකයන් සිටී නම්, පවුල් නැවත එක්වීම සඳහා වන ඔබේ අයිතීන් පිළිබඳව බලධාරීන් ඔබට දැනුම් දෙනු ඇත. හේතුවක් නොමැතිව පලා නොයන්න.
- ✗ ඔබ පලා ගියහොත්, ඍණාත්මක ප්‍රතිවිපාක ඇති වේ, ඒ පිළිබඳ විස්තර පත්‍රිකාවේ පැහැදිලි කර ඇත. උදාහරණයක් ලෙස, ඔබට අනෙක් රට තුළ දී අඩු සහායක් පිළිගැනීමේ දී ලැබෙනු ඇත.
- ✓ බලධාරීන් ඔබට වෙනත් ආකාරයකින් දැනුම් දුන්නේ නම් මිස, ඔබ මුලින් ම පැමිණි EU+ රටෙහි ඔබේ රැකවරණ අයදුම්පත ලියාපදිංචි කළ යුතු බව මතක තබා ගන්න.
- ✓ ඔබේ රැකවරණ අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා වගකිව යුත්තේ මෙම රටවලින් එකක් පමණි. ඉතාලි බලධාරීන් මේ සඳහා වගකිව යුතු රට කුමක්ද යන්න ඔබට පවසනු ඇත.

මෙම ක්‍රියාපටිපාටි පිළිබඳව ඔබ වෙනම විස්තර පත්‍රිකාවලින් වැඩිදුර දැනගනු ඇත.

## ඔබ EU+ රටවලින් එකකට පලා ගියහොත් කුමක් සිදුවේද?




**ඉතාලියෙහි:**

- ඔබේ රැකවරණ ක්‍රියාපටිපාටිය නතර විය හැකිය.

**අනෙක් EU+ රටෙහි:**

- ඔබ හැර ගිය EU+ රටට ඔබව ආපසු යැවීමට බලධාරීන් තීරණය කළ හැකිය.

බලධාරීන් මෙම තීරණය පිළිබඳ ව ඔබට දැනුම් දුන් මොහොතේ සිට, ඔබට ඇතැම් අයිතීන් සඳහා ප්‍රවේශය නොලැබෙනු ඇත, උදාහරණයක් ලෙස:

- ඔබට ඇතැම් ආකාරයේ සහායන් නොලැබෙනු ඇති අතර
- ඔබට රැකියාවක නිරත වීමට අවසර නොලැබෙනු ඇත.

### බලධාරීන් විසින් ගනු ලබන තීරණයකට ඔබ එකඟ නොවන්නේ නම්, ඔබට උපකාර කළ හැක්කේ කාටද?

ඔබට ඔබේ භාරකරු සමඟ කතා කර ඕනෑම ප්‍රශ්නයක් ඇසිය හැකිය.

ඔබේ භාරකරු සමඟ එක්ව ඔබට නීති උපදේශකයෙකුගෙන් උපකාර ඉල්ලා සිටිය හැකිය.

නීති උපදේශකයෙකු යනු මේ රටේ නීති දන්නා සහ ඔබේ තත්ත්වය අධ්‍යයනය කර ඔබට සහාය විය හැකි පුද්ගලයෙකි.



ඔබට තොරතුරු සහ සහාය ලබා දිය හැකි රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳව ද කාර්ය මණ්ඩලය ඔබට දැනුම් දෙනු ඇත.




ඔබට ඕනෑම වේලාවක එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය (UNHCR) සම්බන්ධ කරගත හැකිය. තම රට හැර යාමට සිදු වන පුද්ගලයින් UNHCR ආරක්ෂා කරයි.

## යම් සහායක් වෙනස් වුවහොත් කුමක් සිදුවේද?

14 වන පිටුවේ පැහැදිළි කර ඇති පරිදි තත්ත්වය හේතුවෙන් ඇතැම් ආකාරයේ සහාය සීමා කිරීමට හෝ අවලංගු කිරීමට බලධාරීන්  තීරණය කරන්නේ නම් ඔබට තවමත් පහත දේ කළ හැකි වනු ඇත:



- පාසල් යාමට



- වෛද්‍යවරයෙකු හෝ හෙදියක හමුවී වෛද්‍ය සහාය ලබා ගැනීමට



- ඔබේ පුද්ගලික තත්ත්වය සහ අවශ්‍යතා මත පදනම්ව උපකාර ලබා ගැනීමට, එනම් බලධාරීන් විසින් තීරණය කරන ලද ස්ථානයක නිදා ගැනීමට ස්ථානයක් සහ යම් සහායක් ලබා ගැනීමට

ඔබ පලා ගොස් වෙනත් EU+ රටකට සංක්‍රමණය වීම නිසා ඔබට ලබා දුන් පිළිගැනීමේ සහාය අවලංගු කිරීමට බලධාරීන් තීරණය කළ විට, ඔබට තවමත් ලැබෙන සහාය ඔබේ පුද්ගලික තත්ත්වය සහ අවශ්‍යතා මත රඳා පවතී. ඔබට තවමත් පාසල් යාමට හැකි වනු ඇත.

මෙම විස්තර පත්‍රිකාව තොරතුරු දැනගැනීමේ අරමුණු සඳහා පමණි. එමඟින් අයිතීන් හෝ වගකීම් නිර්මාණය නොකරයි. මෙම ලේඛනයේ ප්‍රධාන කොටස සපයා ඇත්තේ යුරෝපීය සංගමයේ රැකවරණය සඳහා වූ ආයතනය (EUAA) විසින් වන අතර, මෙම විස්තර පත්‍රිකාව පිටපත් කිරීම සහ වෙනස් කිරීම සඳහා EUAA විසින් අවසර දී ඇත්තේ EU සාමාජික රටවල් සඳහා පමණි. මෙම විස්තර පත්‍රිකාවේ ඇතුළත් තොරතුරුවල නිරවද්‍යතාවය, අන්තර්ගතය, පරිපූර්ණත්වය, නීත්‍යානුකූලභාවය හෝ විශ්වසනීයත්වය සඳහා EU සාමාජික රටවල හෝ වෙනත් වගකිවයුතු තෙවන පාර්ශවයක කිසිදු වගකීමක් හෝ වගවීමක් EUAA විසින් පිළි නොගැනේ. මෙම විස්තර පත්‍රිකාවේ අන්තර්ගත තොරතුරු මඟින් නිර්මාණය කළ හැකි යම් භාවිතයක් සඳහා EUAA හෝ EUAA වෙනුවෙන් ක්‍රියා කරන කිසිදු පුද්ගලයෙකු වගකිව යුතු නොවේ.

© European Union Agency for Asylum, 2025